# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1494/2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 01/12/2023<br>පැය 1325 |

## මාධ්‍ය නිවේදනය

### 01. ගෙවල් බිඳ දේපල හා මුදල් සොරකම් කිරීමක් සම්බන්ධයෙන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මාවතගම පොලිස් ස්ථානය.

2023.11.27 වන දින මාවතගම පොලිස් වසමේ නුවරපාර, බෝයගොඩ ප්‍රදේශයේ නිවසක් බිඳ මුදල් හා දේපල සොරාගැනිමක් සම්බන්ධයෙන් මාවතගම පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන සිදුකර සැකකරුවන් දෙදෙනෙකු 2023.11.30 වන දින උදෑසන කාලයේ මාවතගම පොලිස් ස්ථානයේ නිලධාරින් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස වයස අවුරුදු 37 ක් හා 31ක් වූ බෝයගොඩ හා කටුපොත ප්‍රදේශවල පදිංචි ආරක්ෂක අංශයේ රාජකාරි කරන පුද්ගලයින් බවට අනාවරණය වී ඇත.**

රාජකාරි කාලය තුල කෙටි විවේකයක් ලබාගෙන මෙම අපරාධ සිදු කර ඇති බව, විමර්ශන වලදි අනාවරණය වන අතර මෙම සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා කුරුණෑගල පොලිස් නිල සුනඛ අංශයේ **"ජෝනී"** නැමති නිල සුනඛයාගේ සහය ලැබී ඇති අතර මේ සම්බන්ධයෙන් මාවතගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

### 02. අතුරුදහන්ව සිටි කාන්තාවකගේ මෘත ශරීරය හමුවීම - වැලිපැන්න පොලිස් වසම.

2022.11.27 වන දින වැලිපැන්න පොලිස් වසමේ හිජ්ජා මාවත ප්‍රදේශයේ පදිංචි කාන්තාවක් අතුරුදහන් වී ඇති බවට වැලිපැන්න පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් සම්බන්ධව විමර්ශන ආරම්භ කර තිබුණි.

එම කාන්තාවගේ බවට සැක කරනු ලබන පාවහන් යුගලක් ඇයගේ නිවස අසලින් ගලා බසින මූණමල්වත්ත ගං ඉවුරේ තිබී හමුවී ඇති අතර 2023.11.30 වන දින දහවල් කාලයේ එම ස්ථානයේ සිට කිලෝමීටර් දොළහක් පමණ දුරින් මීගම ප්‍රදේශයේ ගං ඉවුරේ තිබී අතුරුදහන් වූ කාන්තාවගේ මෘත ශරීරය සොයාගෙන ඇත.

**මරණකාරිය වයස අවුරුදු 24 ක්වූ වැලිපැන්න ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වැලිපැන්න පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - අම්බලන්ගොඩ පොලිස් වසම.

2023.12.01 වන දින අළුයම් කාලයේ අම්බලන්ගොඩ පොලිස් වසමේ ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේදී අම්බලන්ගොඩ පොලිස් ස්ථානය ආසන්නයේදී කොළඹ දෙස සිට ගාල්ල දෙසට ධාවනය වූ ලොරි රථයක් එහි රියදුරුට නින්ද යාම හේතුවෙන් මාර්ගයෙන් ඉවතට පැන පෙරලී යාමෙන් අනතුරක් සිදුව ඇත.

මෙම අනතුර හේතුවෙන් ලොරි රථයේ පිටුපස ගමන් කල පුද්ගලයෙකු එම රථයේ පටවා ගෙන යන ලද කොන්ක්‍රීට් කලවම් කරන යන්ත්‍රයට යටවීමෙන් තුවාල ලබා බලපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 43 ක් වූ බද්දේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු.**

මෘත ශරීරය බලපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් අම්බලන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**